# කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරීත්වය පහළ මට්ටමක පැවතීමට බලපාන සාධක පිළිබඳ අධ්‍යයනය : අම්පාර දිස්ත්‍රික්කය ඇසුරින්

එම්.කේ.අයි.ඒ.බණ්ඩාර

*සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*
bandaraisuru418@gmail.com

**සංක්ෂේපය**

*ශ්‍රී ලංකාවේ ජනගහනය සංයුතිය, අධ්‍යාපන තත්ත්වය අනුව පුරුෂ ජනගහනයට වඩා ස්ත්‍රීන්ගේ වර්ධනයක් දක්නට ලැබුනද, ශ්‍රී ලංකාව තුළ කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරීත්වය පහළ මට්ටමක පවතින බව කිව හැක. ශ්‍රම බලකාය තුළ කාන්තාවන්ගේ දායකත්වය අවම මට්ටමක පැවැතීම ලෝක මට්ටමේ ගැටලුවකි. මෙහි අධ්‍යයන අරමුණ වන්නේ අම්පාර දිස්ත්‍රික්කයේ කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරීත්වය පහළ මට්ටමක පැවතීමට බලපාන සාධක අධ්‍යයනය කිරීමයි. උප අරමුණු වශයෙන් ආර්ථික සාධක, සමාජීය සාධක, ප්‍රජා විද්‍යාත්මක සාධක මෙන්ම කාන්තාවන්ගේ අධ්‍යාපනය ශ්‍රම සහභාගිත්වය කෙරෙහි ඇති කරන බලපෑම විමසා බැලීම සිදු කරයි. මෙම අධ්‍යයනයට කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය අවම වශයෙන් පවතින දිස්ත්‍රික්කයක් ලෙස අම්පාර දිස්ත්‍රික්කය තෝරා ගත් අතර එහි මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ග්‍රාම සේවා වසම් හතරක් තුලින් 92 ක නියැදියක් සම්භාවිතා නියැදුම් ක්‍රමයක් වන පොකුරු නියැදීම යටතේ තෝරා ගන්නා ලදී. කාන්තාවන් ආර්ථිකයට ක්‍රියාකාරී නොවීමට බලපාන සාධක වන කාන්තාවගේ මවගේ හා පියාගේ අධ්‍යාපන මට්ටම්, උසස් අධ්‍යාපනයට මෙන්ම රැකියාවකට යොමු නොවීමට බලපාන හේතු සාධක, අධ්‍යාපනය ලැබූ පාසල, නිවසේ තත්ත්වය ආදී සමාජීය සාධකත්, එසේම වයස, විවාහකත්වය, විවාහක වයස, විවාහ වූ ආකාරය, සාඵල්‍යතා මට්ටම්, රෝගයකින් පෙළීම, සංක්‍රමණ ආදී ප්‍රජා විද්‍යාත්මක සාධකත්, එසේම පවුලේ ආදායම, පවුලේ ආර්ථික කටයුතුවලට සම්බන්ධ වීම, ආදායම් උපයන්නාගේ රැකියාව, පෙර නිරත වූ රැකියාව, කාල සීමා හා වැටුප්, ප්‍රදේශයේ පවතින රැකියා මට්ටම්, සහනාධාර යන ආර්ථික සාධක අධ්‍යයනය කරන ලදී. එමෙන්ම දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම, සහසම්බන්ධතා සංගුණක, ප්‍රතිපායනය, සාධක විශ්ලේෂණය, කයි වර්ග පරීක්ෂාව යන දත්ත විශ්ලේෂණ ක්‍රම යොදා ගන්නා ලදී. ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන පවුල්වල ඉතුරුම් ප්‍රමාණය කෙරෙහි පවුලේ ආදායමෙහි බලපෑම පරීක්ෂා කිරීමේදී ඉහළ ධන සහසම්බන්ධතාවයක් පවතින බව දැක ගත හැකි විය. සාධක විශ්ලේෂණය තුලින් කාන්තාව ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවීමට බලපාන ප්‍රධාන සාධක පහකට බෙදා ගත හැකි විය. මෙහිදී ගත හැකි ප්‍රධානම නිගමනය වූයේ කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන බව සම්පූර්ණ සත්‍යයක් නොවන බවයි. නිවෙසේ වැඩ කටයුතු, දරුවන් රැකබලා ගැනීමට, අමතරව පවුලේ ආර්ථික කටයුතු සඳහා දායක වීම කාන්තාවන්ට පැවරී තිබේ. එසේම මෙම ප්‍රදේශය රැකියා අවස්ථා පැවතීම 69.56%ගේ අදහස රැකියා අවස්ථා සුළු ප්‍රමාණයක් පමණක් ඇති බවයි. ප්‍රදේශය තුළ ආර්ථික වශයෙන් ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීමට ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, නව රැකියා අවස්ථා ලබාදීම, ඉඩම් ගැටලු විසඳීම, අධ්‍යාපන අවස්ථා වැඩි දියුණු කිරීම, ණය ආධාර ලබාදීම වැනි දේ අවශ්‍ය වන බව යෝජනා කළ හැකිය.*

**මූඛ්‍ය පද :** ආර්ථික ක්‍රියාකාරිත්වය, කාන්තාව, ප්‍රජා විද්‍යාත්මක, සමාජීය

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ රජය විසින් කාන්තාවන්ගේ සමාජ, ආර්ථික හා සෞඛ්‍යය වෙනුවෙන් වාර්ෂිකව ඉතා ඉහළ වියදමක් දරයි. විශේෂයෙන් අධ්‍යාපනය වෙනුවෙන් රජය විශාල වියදමක් දරන අතර ලංකාවේ අධ්‍යාපන කේෂ්ත්‍රය තුළ වැඩිම සහභාගිත්වයක් කාන්තාවන් දරයි. නමුත් ඉහළ අධ්‍යාපනයක් ලැබූ කාන්තාවන්ගේ පවා ශ්‍රම සහභාගිත්වය මෙන්ම දේශපාලන සහභාගිත්වය ඉතා පහළ අගයක් ගනි (රත්නායක, 2016). කාන්තාවන්ගේ සෞඛ්‍යය ඉහළ නැංවීම සඳහා මාතෘ සෞඛ්‍යය වැඩසටහන් හා සුවනාරි සායන රට පුරා ක්‍රියාත්මක වේ. සමාජ ආරක්ෂණය හා රැකියා අවස්ථා සඳහා ද ශ්‍රී ලංකාව තුළ ඉහළ පහසුකම් ඇත (පුෂ්පකුමාර, 2019). ශ්‍රී ලංකාව තුළ මෙම ප්‍රශ්නය වඩා වැදගත් මුහුණුවරක් ගනු ලබන්නේ ශ්‍රම බලකා සහභාගීත්වය තුළ කාන්තාවන් හා පිරිමින් අතර විශාල පරතරයක් මෙන්ම උසස් අධ්‍යාපනය තුළද කාන්තාවන් හා පිරිමින් අතර පරතරයක් පැවතීමයි. අධ්‍යාපනය යනු රටක මානව ප්‍රාග්ධනය ගොඩනැගීමේ ක්‍රමවේදයයි. ආර්ථිකයක ඉදිරි ගමන තීරණය කරන එක් සාධකයක් ලෙස මානව ප්‍රාග්ධනය හැඳින්විය හැකිය. ඒ අනුව මානව ප්‍රාග්ධනයේ ප්‍රමාණය, ගුණාත්මකභාවය හා එහි උපයෝජනය ආර්ථිකයට වැදගත් වේ (මහ බැංකු වාර්තාව, 2016).

2018 ලෝක කම්කරු සංවිධානයට අනුව ලෝකයේ විවිධ කලාප අනුව කාන්තාවන් ක්‍රියාකාරී නොවීමේ ඉහළම අගය මැද පෙරදිග (අරාබි කලාපයෙන් ) වාර්තා වන අතර එම අගය 81.1% වේ. 2000 වර්ෂයේදී එම අගය 83.7% හා 2011 දී 81.6% ලෙස වාර්තා විය. දෙවනුවට ක්‍රියාකාරී නොවීම උතුරු අප්‍රිකානු කලාපයෙන් 78.1% ලෙස වාර්තා වන අතර 2000 දී එම අගය 77.9% හා 2011 දී 75.8% ලෙස පැවති අතර 2018 වන විට කාන්තාවන් ක්‍රියාකාරී නොවීමේ වර්ධනයක් දැකිය හැකි වීමයි. ලෝකයේ ඉහළම ජනගහනයක් ඇති ආසියානු කලාපය තුළ දකුණු ආසියාවේ 72.4% ක ඉහළ ආර්ථික ක්‍රියාකාරී නොවීමක් දක්නට ලැබෙන අතර 2000 වර්ෂයේදී එම අගය 64.1% හා 2011 දී 68.2% වීම මගින් 2018 වන විට ක්‍රියාකාරී නොවීමේ වර්ධනයක් දැකිය හැකිය. නැගෙනහිර ආසියාව හා උප සහරා කලාප වල පහළ ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවීමක් දැකිය හැකිය (ලෝක කම්කරු සංවිධානය, 2018 ). ශ්‍රී ලංකාව තුළ දිස්ත්‍රික්ක අනුව කාන්තාවන් ක්‍රියාකාරී නොවීම අනුව 76% ත්‍රිකුණාමලය, 76.8% අම්පාර, 78.3% මඩකලපුව, 77.2% කිලිනොච්චිය ලෙස කාන්තාවන් ඉහළම ක්‍රියාකාරී නොවීමක් දක්නට ලැබේ. විශේෂයෙන් නැගෙනහිර හා උතුරු පළාත්වල ඉහළම කාන්තා ක්‍රියාකාරී නොවීම් දක්නට ලැබෙන බව පෙනී යයි (ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණ වාර්තාව, 2018).

### 1.1 අධ්‍යයනයේ වැදගත්කම

ශ්‍රී ලංකා රජය වාර්ෂිකව රාජ්‍ය වියදමින් සමාජ සේවා වියදම් යටතේ, අධ්‍යාපනය වෙනුවෙන් 1.7%ක් වෙන්කරනු ලබයි (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2017). එය අනාගත මානව ප්‍රාග්ධනය ගොඩනැගීමට වර්තමානයේ දරන වියදමකි. නමුත් මෙම රාජ්‍ය වියදම් යටතේ අධ්‍යාපනය ලබා ගන්නා කාන්තාවන් බහුතරය ශ්‍රම වෙළඳපොළට ඇතුලත් නොවීම තුළ වියදම්හි උපයෝජනය සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් ඇති වේ. රාජ්‍ය වියදම් උපයෝජනය විධිමත් කිරීමට අවශ්‍ය තීරණ ගැනීමට මෙම අධ්‍යයනය වැදගත් වේ. රටේ ආර්ථික වර්ධනයට වැදගත් වීම රටක ආර්ථික වර්ධනය තීරණය වීමට එරට සතු සම්පත් සම්භාරය වැදගත් වේ. ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කාන්තාවන් ඉහළ මට්ටමින් අධ්‍යාපනය ලැබුව ද, එම ශ්‍රම සම්පත නැවත ආර්ථිකයට, ශ්‍රම බලකායට එකතු නොවේ. ආර්ථික වර්ධනය තීරණය කිරීමට වැදගත් වන සාධකයක් බැවින් මෙම අධ්‍යයනය ඉතා වැදගත් වේ.

කාන්තාවන්ගෙන් බහුතරයක් ශ්‍රම බලකායට සහභාගී නොවීම ජාතික වශයෙන් මුහුණ දෙන වැදගත් ප්‍රශ්නයක් බවට පත්ව ඇත. එම නිසා මෙම ජාතික වැදගත්කමක් පවතින ප්‍රශ්නය අධ්‍යයනය තුලින් ඒ සම්බන්ධයෙන් පවතින දැනුම් සම්භාරය ඉහළ යනු ලබයි. ඒ තුළ ගැටලුවට විසඳුම් සෙවීම පහසුවේ.

### 1.2 අධ්‍යයන අරමුණ

අම්පාර දිස්ත්‍රික්කයේ කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරීත්වය පහළ මට්ටමක පැවතීමට බලපාන ආර්ථික සාධක, සමාජීය සාධක, ප්‍රජා විද්‍යාත්මක සාධක හා අධ්‍යාපනය ශ්‍රම බල සහභාගීත්වයට ඇති කරන බලපෑම අධ්‍යයනය කිරීම.

## 2. සාහිත්‍ය විමර්ශනය

ශ්‍රම බලකාය තුලත්, දේශපාලන වශයෙනුත් ස්ත්‍රීන්ගේ දායකත්වය පුරුෂයන්ට වඩා පැහැදිලි අඩු වීමක් දැකගත හැක. එසේම ආර්ථික වශයෙන් ක්‍රියාකාරි නොවන ප්‍රමාණය වැඩිම ප්‍රමාණයක් ස්ත්‍රීන් වේ (ශ්‍රම බල සමීක්ෂණ වාර්තාව, 2018). ලෝකයේ, යුරෝපයේ මෙන්ම සමස්ථ ආසියාතික කලාපය තුළ ද මෙම තත්ත්වය දැකගත හැකිය (ලෝක කම්කරු සංවිධානය, 2018). මේ තත්ත්වය ලෝකයේ සංවර්ධන ක්‍රියාවලියට දැඩි බාධාවක් වේ. විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල් වලට මෙය බොහෝ සේ බලපායි (ආසියා සංවර්ධන බැංකුව, 2012). ශ්‍රී ලංකාවේ රජය විසින් කාන්තාවන්ගේ සමාජ, ආර්ථික හා සෞඛ්‍යය වෙනුවෙන් වාර්ෂිකව ඉතා ඉහළ වියදමක් දරයි. විශේෂයෙන් අධ්‍යාපනය වෙනුවෙන් රජය විශාල වියදමක් දරන අතර ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ වැඩිම සහභාගිත්වයක් කාන්තාවන් දරයි (මහ බැංකු වාර්තාව, 2018). නමුත් ඉහළ අධ්‍යාපනයක් ලැබූ කාන්තාවන්ගේ පවා ශ්‍රම සහභාගිත්වය මෙන්ම දේශපාලන සහභාගිත්වය ඉතා පහළ අගයක් ගනි. එසේම කාන්තාවන්ගේ සෞඛ්‍යය ඉහළ නැංවීම සඳහා මාතෘ සෞඛ්‍යය වැඩසටහන් හා සුවනාරි සායන රට පුරා ක්‍රියාත්මක වේ. සමාජ ආරක්ෂණය හා රැකියා අවස්ථා සඳහා ද ශ්‍රී ලංකාව තුළ ඉහළ පහසුකම් ඇත. මෙවන් තත්ත්වයක් පවතිද්දීත් ලංකාවේ ශ්‍රම බලකායේ ස්ත්‍රීන්ගේ දායකත්වය අඩු වීමත් විශාල ගැටලුවකි (මහ බැංකු වාර්තාව, 2016). ශ්‍රී ලංකාව 2010 වසරේ මධ්‍යම ආදායම් ලබන රටක් වශයෙන් නම් කරන ලදි. නමුත් තවමත් ශ්‍රම බලකායට කාන්තාවන්ගේ දායකත්වය ඉතා පහළ මට්ටමක පවතී. ලෝකයේ රටවල් හා බලන කල ශ්‍රම බලකායට කාන්තාවන්ගේ දායකත්වය ඉතාමත් අඩු මට්ටමක පවතින රටකි (ශ්‍රම බල සමීක්ෂණ වාර්තාව, 2018). ශ්‍රී ලංකාවේ ළඳරු මර්ත්‍යතාවය ස්ත්‍රී ශ්‍රම බල දායකත්වය හා ඔවුන්ගේ අධ්‍යාපනය අතර සම්බන්ධතාවය සාකච්ඡා කර ඇත. ඉහළ අධ්‍යාපනය ලද කාන්තාවන් ඉහළ ආදායමක් ලැබීමට හා වඩා හොද සමාජ තත්ත්වයක් ඇති කර ගැනීමට බලාපොරොත්තු වන්නේ ශ්‍රම බලකායට දායක වීම හෝ ධනවත් පුද්ගලයෙක් විවාහ කර ගැනීම තුලිනි (විභූති, 2014). පසුගිය දශක කිහිපය තුළ කාන්තාවන් අධ්‍යාපනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව කැපී පෙනෙන මට්ටමක් ලබා ඇත. ඔවුන්ගේ කාර්යසාධනය ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ ඉහළ මට්ටමක පවතී. කෙසේ වෙතත් කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වයේ එකතැන පල්වීම හා මන්දගාමීව හැකිලීමේ ප්‍රවණතාව සනාථ කරයි. කාන්තාවන්ගේ අධ්‍යාපනය ශ්‍රම වෙළඳපොළට සහභාගී වීමට ඔවුන් දිරිමත් කර නොමැති බව සහ වැටුප් වෙනස්කම් කිරීම ශ්‍රී ලාංකික සන්දර්භය තුළ කාන්තාවන්ගේ බහු භූමිකාවන් සහ ළමා රැකවරණ පහසුකම් තිබීම කාන්තා ශ්‍රමයට බලපාන වෙනත් සාධක ලෙස ගවේෂණය කර ඇත (සේමසිංහ, 2017).

Getting to Work 2017 වාර්තාවට අනුව විවාහය යන්න කාන්තාවන් ශ්‍රම වෙළඳපොල වෙත සහභාගීත්වය අවම කර ගැනීම සඳහා ක්‍රියා කරන්නක් වන බව තහවුරු කරයි. විවාහය, කාන්තාවන් වෙත වැටුප් හිමි රැකියා ලැබීමේ අවස්ථාව සියයට 26 ක විශාල අගයකින් අඩු කර ඇති නමුත් පිරිමින් හමුවේ එය සියයට 2.5 කින් ඉහළ දමා ඇත (Unlocking Women's Potential in Sri Lanka's Labor Force, 2017). සාඵල්‍යතාවය හා කාන්තා ශ්‍රම සහභාගීත්වය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් ඇති බව බොහෝ අධ්‍යයනවලින් හෙලි වී ඇත. දකුණු ආසියාතික රටවල පළමු දරුවන් දෙදෙනා පිරිමි දරුවන් නම් කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී වීමට අඩු කැමැත්තක් දක්වන අතරම සංවර්ධනය වෙමින් පවතින රටවල දරුවන් සංඛ්‍යාව වැඩි නම් කාන්තාවන් රැකියා කිරීමට අඩු කැමැත්තක් දක්වයි (ආසියානු සංවර්ධන බැංකුව, 2012). කාන්තාවන්ගේ ශ්‍රම බල හැසිරීම ඔවුන්ගේ ස්වාමිපුරුෂයන්ගේ ආදායම් මට්ටම මත තීරණය වේ. ස්වාමිපුරුෂයන්ට ඉහළ ආදායමක් ලැබීම යනු කාන්තාවන්ගේ වැඩ කරන කාලය අඩු වීම හා නිවසේ ගත කරන කාලය වැඩි වීමයි (Mincer, 2002).

සමාජයේ පවතින ආකල්පද, කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවීම කෙරෙහි බලපායි. සාමාන්‍යයෙන් කාන්තාවන්ට සමාජය තුළ දරුවන් රැක බලා ගැනීම, නිවසේ කටයුතු, වැඩිහිටි රැකවරණය හා පවුලේ වගකීම් පැවරී තිබේ. ලෝකයේ සෑම 10 දෙනෙකුගෙන්ම 4 දෙනෙක්ම කාන්තාව ස්වාමියාට වඩා පහළ රැකියාවක නිරත විය යුතු බව පිළිගනී. සංවර්ධනය වෙමින් පවතින රටවල සෑම දෙදෙනෙකුගෙන් එක් අයෙක්ම එම අදහස අනුමත කරයි. පර්යේෂණ මගින් පෙන්වා දෙන පරිදි කාන්තාව රැකියා නොකිරීමට මෙම තත්ත්වයද බලපෑම් කර ඇත (ලෝක සංවර්ධන වාර්තාව, 2012). විශේෂයෙන් පුරුෂ මූලික ගෘහ කුටුම්භයක මෙය පවතී. බංගලාදේශය ශක්තිමත් ආගමික හා සංස්කෘතික පදනමක් සහිත වේ. කාන්තාව ආර්ථික වශයෙන් ක්‍රියාකාරී වීම ගෘහ මූලිකයාගේ ආකල්ප මත රඳා පවතී. එසේම පවුල් වල සිටින පුරුෂ උපයන්නන් ප්‍රමාණය මත එම පවුලේ කාන්තා ශ්‍රම බල සහභාගීත්වය තීරණය වේ (ILO, 2014). සමාජ නිදහස අවම වීම, පීඩාකාරී විවාහයකින් පලා යාම, ගෘහස්ථ හිංසනය හා සම අවස්ථා ඇති වුවමනාව යන කරුණු කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී බව අඩුවේ (Caritas Aotearoa International, 2010). විවාහය මත කාන්තාව සංක්‍රමණය වීමත් සමඟ රැකියාවලින් ඉවත් වීමට සිදුව ඇත (Gunasekara, Najab & Munas, 2015).

### 3. අධ්‍යයන ක්‍රමවේදය

ඉහළම ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවීමක් මඩකලපුව දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. වර්ෂ ගණනාවක් තිස්සේ අඩුම කාන්තා ක්‍රියාකාරීත්වයක් සදහන් වීම, අධ්‍යයනයේ පහසුව, ජනවර්ග කිහිපයක් අම්පාර දිස්ත්‍රික්කය තුළ ජීවත් වීම ආදි කරුණු මත අම්පාර දිස්ත්‍රික්කය අධ්‍යයනය සඳහා තෝරා ගැනීම ඉතා යෝග්‍ය වේ. මෙහිදී අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ග්‍රාම සේවා වසම් 04 ක් ආශ්‍රයෙන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන කාන්තාවන් 92 ක් නියැදිය සඳහා යොදා ගන්නා ලදී . මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත ලබා ගැනීමට ප්‍රශ්නමාලා ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගන්නා ලදී.

එසේම අවශ්‍ය ද්විතීයික දත්ත මාතෘකාවට අදාළව සිදු කරන ලද පූර්ව පර්යේෂණ, ප්‍රකාශිත වාර ප්‍රකාශන සඟරා මගින් ලබා ගැනීමට කටයුතු කරන ලදි. ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා

නියැදිය සකස් කර ගැනීමේදී සම්භාවිතා නියැදුම් ක්‍රමයේ පොකුරු නියැදුම් ක්‍රමය යොදා ගෙන ඇත. රැස් කරගත් ප්‍රාථමික දත්ත යොදා ගනිමින් එම දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම, කයි වර්ග පරික්ෂාව, සහසම්බන්ධතා සංගුණකය සහ සාධක විශ්ලේෂණය ආදි ක්‍රමවේදයන් ඔස්සේ විශ්ලේෂණය කර ඇත.

### 3.1 අධ්‍යයන ප්‍රදේශය

කිසියම් පර්යේෂණයක් සිදු කිරීමේදී එහි අධ්‍යයන ප්‍රදේශය තෝරා ගැනීම ඉතා වැදගත් වේ. එසේ වන්නේ අධ්‍යයන ක්ෂේත්‍රය තුලින් පර්යේෂණයට අදාළ වන මූලික තොරතුරු එක්රැස් කරන බැවිනි. මෙම පර්යේෂණයට අවශ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රය තෝරා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක මට්ටමින් කාන්තාවන්ගේ ආර්ථික වශයෙන් ක්‍රියාකාරීත්වය අවම මට්ටමක පැවතීමේ අනුපාතයන්ට අදාළ ශ්‍රම බල සමීක්ෂණ වාර්තාව අධ්‍යයනය තුලින් අධ්‍යයන ක්ෂේත්‍රය තෝරා ගැනීමට තීරණය කරන ලදී. 2017 ශ්‍රම බල සමීක්ෂණ වාර්තාවට අනුව කාන්තාවන්ගේ ඉහළම ආර්ථික වශයෙන් ක්‍රියාකාරීත්වය පහළ මට්ටමක පවතින දිස්ත්‍රික්ක පහත වගුව මගින් දැක්වේ.

*වගු අංක 1: කාන්තාවන්ගේ ඉහළම ආර්ථික වශයෙන් ක්‍රියාකාරීත්වය පහළ මට්ටමක පවතින දිස්ත්‍රික්ක*

| දිස්ත්‍රික්කය | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|
| මඩකලපුව | 78.3% | 28.8% |
| අම්පාර | 76.8% | 27.6% |
| යාපනය | 73% | 30.4% |
| මන්නාරම | 76.2% | 30.5% |

*මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2017)*

ශ්‍රී ලංකාවේ ඉහළම ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවීමක් මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්ක වලින් වාර්තා වේ. මේ අනුව අධ්‍යයනයේ පහසුව තකා අම්පාර දිස්ත්‍රික්කය අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගන්නා ලදී. අම්පාර දිස්ත්‍රික්කයේ ඉහළම ජනගහනය දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ද අවම ජනගහනය ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේද ජීවත් වේ.

### 3.2 නියැදිය තෝරා ගැනීම

සංගහනයෙන් තෝරා ගන්නා කුඩා කොටසක් හෙවත් උපකුලකය නියැදිය ලෙස හැඳින්වේ. ඒ අනුව මේ තුලින් කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරිත්වය පහළ මට්ටමක පැවතීමට බලපාන සාධක අධ්‍යයනය සඳහා නියැදිය තෝරා ගන්නා ලදි. මෙම අධ්‍යනයේදී සසම්භාවී නියැදුම් ක්‍රම යටතේ නියැදිය තෝරාගැනීමට සිදු විය. සසම්භාවිතා නියැදුම් ක්‍රමවලදී නියැදි ඒකක තේරීම සම්භාවිතා පදනමක් මත සිදුකර ඇත. සසම්භාවී නියැදුම් ක්‍රම භාවිතයෙන් නියැදිය තෝරාගැනීමේදී සියලුම එක් එක් සංගහන ඒකකයන්ට නියැදියට තේරීමට ඇති සමාන අවස්ථාව (1/nCN) තහවුරු වන අතර නියැදිය තේරීමේදී වන පුද්ගල බද්ධතාවය හේතුවෙන් ඇතිවන අභිනතතාව හා ඥාති සංග්‍රහය වැනි දුර්වලතා ද මගහැරී ඇත. මෙම අධ්‍යයනය තුලදී පොකුරු නියැදුම් ක්‍රමය භාවිතා කරමින් නියැදිය තෝරාගෙන ඇත.

*වගු අංක 2 - තෝරාගත් නියැදි ප්‍රදේශ තුළ ජනගහනය*

| | | ජනගහනය | |
|---|---|---|---|
| ග්‍රාම නිලධාරි වසම් | මුළු ජනගහනය | පුරුෂ | ස්ත්‍රී |
| උණුවතුර බුබුල 144/B | 1,686 | 839 | 847 |
| බොරපොල 136A/1 | 939 | 481 | 458 |
| කැලවින්න 136 | 1,506 | 780 | 726 |
| පොල්ලෙබැද්ද 136/B | 1,966 | 1055 | 911 |
| එකතුව | 6,097 | 3,155 | 2,942 |

*මූලාශ්‍රය : ග්‍රාම නිලධාරී වාර්තා (2016)*

මේ අනුව අධ්‍යයන සංගහනය කැලවින්න, බොරපොල, උණුවතුර බුබුල හා පොල්ලෙබැද්ද ග්‍රාම සේවා වසම්වල වෙසෙන කාන්තාවන් 2942ක් වන අතර යමානී ක්‍රමයට අනුව ගණනය කරන ලද නියැදි තරම 92ක් විය.

*වගු අංක 3 : නියැදිය තෝරා ගැනීම*

| ග්‍රාම නිලධාරි වසම් | නියැදි ඒකක සංඛ්‍යාව |
|---|---|
| උණුවතුර බුබුල 144/B | 26 |
| බොරපොල 136A/1 | 15 |
| කැලවින්න 136 | 23 |
| පොල්ලෙබැද්ද 136/B | 28 |
| එකතුව | 92 |


*මූලාශ්‍රය : නියැදි දත්ත (2019)*

## 4. දත්ත විශ්ලේෂණය

### 4.1 ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන කාන්තාවන් විවාහ වූ ආකාරය

ඇත අතීතයේ සිටම විවාහය සිදුවීමේදී ප්‍රේම සම්බන්ධතා පමණක් නොව යෝජිත විවාහ දැකිය හැකි වූ අතර විවාහ වූ ආකාරය ආර්ථිකයට ක්‍රියාකාරී නොවන කාන්තාවන්ට කෙසේ බලපෑමක් වී ඇත්දැයි සොයා බැලිය හැක.

*ප්‍රස්තාර සටහන 1: ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන කාන්තාවන් විවාහ වූ ආකාරය*





*මූලාශ්‍රය : නියැදි දත්ත (2019)*

ප්‍රස්තාර සටහන 1ට අනුව පෙම් සබඳතා මත විවාහ වීම 73.30% ක් වන අතර 26.67% ක් යෝජිත විවාහ වේ. මේ තත්ත්වය මේ ප්‍රදේශයට ආවේණික වේ. අවුරුදු 20 ඉක්ම වූ තරුණියක් සිටී නම් දෙමාපියන් ඉක්මනින් විවාහයක් කර දීමට කටයුතු කරයි. විශේෂයෙන් යුද්ධය පැවති කාලයේ දෙමාපියන් තම දූවරුන් ඉක්මනින් විවාහ කරදීමට පෙළඹීම නිසා මේ තත්ත්වය ඇතිවිය. බොහෝ කාන්තාවන් යුද්ධය පැවති කාලයේ විවාහ වූ හෝ උපන් අය වීම මත මේ තත්ත්වය දැකගත හැක.

## 4.2 ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන කාන්තාවන්ගේ සාඵල්‍යතා මට්ටම

සාඵල්‍යතා මට්ටම් ජාති, ආගම් අනුව ප්‍රදේශ වන ආකාරය අසා තිබුනද ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවීමට දරුවන් සංඛ්‍යාව කෙසේ බලපෑ ඇති දැයි විමසිය යුතුය.

*ප්‍රස්තාර සටහන 2 : ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන කාන්තාවන්ගේ සාඵල්‍යතා මට්ටම .*




*මූලාශ්‍රය : නියැදි දත්ත (2019)*


කාන්තා ශ්‍රම සැපයුම ළමයින් ගණන හා ළමයින්ගෙ වයස මත තීරණය වේ (Mincer, 1962). මේ ප්‍රදේශයේ කාන්තාවන්ගේ සාඵල්‍යතා මට්ටම දෙස බැලීමේදී ආර්ථික වශයෙන් ක්‍රියාකාරී වන කාන්තාවන්ගෙන් 31.94% ක් කට දරුවන් දෙදෙනකු සිටින අතර 8.33% කට දරුවන් එක් කෙනෙක් පමණක් සිටියි. කාන්තාවන්ගෙන් 36.11% කට දරුවන් තුන් දෙනෙක් සිටී. දරුවන් එක් අයෙක් හෝ නැති කාන්තාවන් 4% ක් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන කාන්තාවන් අතර සිටි. දරුවන් සිටීම මත ඔවුන් රැකබලා ගැනීමට කිසිවෙකුත් නොමැති වීමත් රැකියාවලට යාම ඉතා දුර බැහැර නිසා දරුවන් කෙරෙහි අවධානය යොමු කිරීම අපහසු නිසා ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවේ. කුඩා දරුවන් සිටින කාන්තාවන් හා ආර්ථික වශයෙන් ක්‍රියාකාරී වීම අඩුය. ඔවුන් තරමක් වැඩි මහලු වූ විට එම කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී වේ (Hyslop, 1999).

තවද ප්‍රස්තාර සටහන 2ට අනුව කාන්තාවන්ගේ වයස් මට්ටම දෙස බැලීමේදී වැඩිම කාන්තාවන් ප්‍රමාණයක් 15-34 වයස් කාණ්ඩයට අයත් වේ. මේ තත්ත්වය තුළ හඳුනා ගත හැක්කේ මෙම කාන්තාවන් බිහි කළ දරුවන් තවමත් කුඩා දරුවන් බවයි. මේ කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවීම කෙරෙහි ඉහළ බලපෑමක් ඇති කරයි.

### 4.3 ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන කාන්තාවන්ගේ පවුලේ ආදායම් උපයන්නාගේ රැකියාව අතර සම්බන්ධතාවය

පවුලේ ආදායම අඩු, වැඩි වීම කාන්තාවන් රැකියාවක් කිරීම හා නොකිරීමට ඉහළ බලපෑමක් කරයි. එනම් මෙම ප්‍රදේශය තුළ ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන කාන්තාවන්ගේ පවුල්වල ආදායම් උපයන්නාගේ රැකියාව විමසිය යුතුමය.

*ප්‍රස්තාර සටහන 3 : ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන කාන්තාවන්ගේ පවුලේ ආදායම් උපයන්නාගේ රැකියාව අතර සම්බන්ධතාවය .*





*මූලාශ්‍රය : නියැදි දත්ත (2019)*

ප්‍රස්තාර සටහන 3ට අනුව පවුලේ ආර්ථික කටයුත්තකට සහය දැක්වීම ඉහළම අගයක් එනම් 46.65%ක් ගොවිතැන් කරන පවුල්වල වේ. ස්වාමියා ගොවිතැන් කටයුතුවල නිරත වන විට පවුලේ සියලු දෙනාගෙන් ඊට සහයෝගය ලැබේ. මේ ප්‍රදේශයේ සෑම පවුලකටම අක්කරයකට වඩා වැඩි ඉඩම් ප්‍රමාණයක් තිබේ. මේ නිසා කුමන රැකියාව කළත් බොහෝ පවුල් ආර්ථික කටයුතුවල නිරත වෙයි. මේ තත්ත්වය කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවීමට හේතු වී තිබේ. එනම් පවුලේ ආදායම් උපයන්නන්ගෙන් 14.13% ක් රජයේ රැකියාවල මෙන්ම ස්වයං රැකියාවල නිරත වේ. මීට අමතරව 15.21% ක් පෞද්ගලික රැකියාවල නිරත වේ. රජයේ රැකියා කරන බහුතරයක් ආරක්ෂක අංශයේ සේවයේ නිරත වේ. ඊට අමතරව පවුලේ ආදායම තුලට පවුලේ ආර්ථික කටයුතු ඇතුලත්ව ඇත. එනම් ආරක්ෂක අංශයේ සේවයේ යෙදුනද ගොවිතැන් කටයුතු ද සිදු කරන නිසා ඇතැම් හමුදා, සිවිල් ආරක්ෂක හා පොලිසිය සේවය කරන අයගේ පවුල්වල ආදායම ඉහළ වේ .

### 4.4 කාන්තාවන් සඳහා රැකියා අවස්ථා පැවතීම

ග්‍රාමීය, නාගරික, වතු අනුව ප්‍රදේශ පැවතියද ඒ ඒ ප්‍රදේශ තුළ රැකියා අවස්ථා පැවතීම වෙනස් වේ. නියැදි ප්‍රදේශය ද සෑම අතින්ම සුවිශේෂි ප්‍රදේශයක් බැවින් රැකියා අවස්ථා පැවතීමේ ස්වාභාවය අධ්‍යයනය කළ යුතුය.

*ප්‍රස්තාර සටහන 4 : ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන කාන්තාවන් සිටින නියැදි ප්‍රදේශයේ කාන්තාවන් සඳහා රැකියා අවස්ථා පැවතීම*




*මූලාශ්‍රය : නියැදි දත්ත (2019)*


Salway (2003) කරන ලද අධ්‍යයනයකට අනුව කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවීම කෙරෙහි පදිංචිව සිටින ස්ථානයද බලපායි. ග්‍රාමීය, අංශයට වඩා නාගරික ප්‍රදේශවල කාන්තාවන් වඩා උගත් අතර හා ආර්ථික වශයෙන් ක්‍රියාකාරී වීමට විධිමත් අංශවල රැකියාව පවතී. ප්‍රස්තාර සටහන 4ට අනුව කාන්තාවන්ගෙන් 11.96% කගේ අදහස වන්නේ මේ ප්‍රදේශය රැකියා නොමැති බවයි. 69.56%ගේ අදහස වන්නේ රැකියා අවස්ථා සුළු ප්‍රමාණයක් පවතින බවයි. 18.48% ගේ අදහස රැකියා අවස්ථා ප්‍රමාණයක් පවතින බවයි. නමුත් බොහෝ රැකියා ප්‍රමාණයක් පවතින බව ප්‍රකාශ කළ බොහෝ දෙනා ආර්ථික වශයෙන් ක්‍රියාකාරී වීමේ අවශ්‍යතාවක් නොපවතින බව ප්‍රකාශ කළ අය වේ.

ඉන්දියාවේ කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවීම කෙරෙහි එම ප්‍රදේශය කාන්තාවන්ට පවතින රැකියා සීමිත වීම බලපා තිබේ (දාස්, 2006). මෙම ප්‍රදේශ කාන්තාවන් සඳහා පවතින රැකියා සීමිත වීම ඔවුන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවීම වීමට බලපා ඇති බව නිගමනය කළ හැක.

### 4.5 ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම

අධ්‍යාපන මට්ටම මත රැකියාවේ තත්ත්වය හා වැටුප් ලැබීම, රැකියාවක නිරත වීමේ කාලය තීරණය වීමට ඉහළ බලපෑමක් කළද, මෙම ප්‍රදේශය තුළ අධ්‍යාපන මට්ටම කුමන ආකාරයක පවතීද යන්න විමසිය යුතුය.

*ප්‍රස්තාර සටහන 5 : ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම*




*මූලාශ්‍රය : නියැදි දත්ත (2019)*

ප්‍රස්තාර සටහන 5ට අනුව ආර්ථිකයට ක්‍රියාකාරී නොවන කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම හඳුනා ගැනීමේදී කාන්තාවන්ගෙන් 46.70% ක් ම සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලබා ඇත. ඉන් ඉහළ අධ්‍යාපනය සඳහා යොමු වී ඇත්තේ 30% වැනි ප්‍රමාණයකි. මෙම ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන කාන්තාවන්ගෙන් 3.30% ක් කිසිදා පාසල් නොගිය අය වේ. 5.40% ක් 5 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා ඇති අතර 3.30% ක් 8 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා ඇත. මුළු කාන්තාවන්ගෙන් 10.90% ක් 10 වසර තෙක් අධ්‍යාපනය ලබා ඇත . මෙමගින් ගම්‍ය වන්නේ මේ ප්‍රදේශයේ කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම් පහළ අගයක් ගන්නා බවත් එයට මෙම ප්‍රදේශයේ පාසල් හා යටිතල පහසුකම් බලපා ඇති බවයි. උසස් අධ්‍යාපනය ලැබූ සියලු කාන්තාවන් වෙනත් ප්‍රදේශවල සිට විවාහයෙන් පසු මෙහි පැමිණි අය වේ. අධ්‍යාපන මට්ටම අඩු නිසා රැකියා නොකිරීම කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවීමට බලපාන හේතු අතර අධ්‍යාපන මට්ටම අඩුවීම ද හේතු වී ඇත.

කාන්තාවන් ආර්ථිකයට ක්‍රියාකාරී නොවීමට බලපාන උසස් අධ්‍යාපනයට යොමු වීම හා විවාහ වන වයස අතර ස්වායත්තතාව පරීක්ෂා කිරිමේදී ($x^2$= 13.438, P=0.338 ) එම විචල්‍ය අතර සම්බන්ධතාවයක් නොපවතින බව පෙන්නුම් කර ඇත. කාන්තාවන් ආර්ථිකයට ක්‍රියාකාරී නොවීමට බලපාන රෝගීබාවයෙන් පෙළීම හා අධ්‍යාපන මට්ටම අතර ස්වායත්තතාව පරීක්ෂා කිරිමේදී ($x^2$=46.135, P=0.000) එම විචල්‍ය අතර සම්බන්ධතාවයක් පවතින බව පෙන්නුම් කර ඇත. කාන්තාවන් ආර්ථිකයට ක්‍රියාකාරී නොවීමට බලපාන දෙමාපියන්ගේ බලපෑම හා පවුලේ ආදායම් මට්ටම අතර ස්වායත්තතාව පරීක්ෂා කිරිමේදී ($x^2$=6.862, P=0.552 ) එම විචල්‍ය අතර සම්බන්ධතාවයක් නොපවතින බව පෙන්නුම් කර ඇත.

කාන්තාවන් ආර්ථිකයට ක්‍රියාකාරී නොවීමට බලපාන රැකියාවක් අවශ්‍ය නොවීම හා පවුලේ ආදායම් මට්ටම අතර ස්වායත්තතාව පරීක්ෂා කිරිමේදී ($x^2$= 4.831, P= 0.305) එම විචල්‍ය අතර සම්බන්ධතාවයක් නොපවතින බව පෙන්නුම් කර ඇත. කාන්තාවන් ආර්ථිකයට ක්‍රියාකාරී නොවීමට බලපාන විවාහ වීම හා කාන්තාව විවාහ වන වයස අතර ස්වායත්තතාවය පරීක්ෂා කිරිමේදී ($x^2$= 16.436, P= 0.172) එම විචල්‍ය අතර සම්බන්ධතාවයක් නොපවතින බව පෙන්නුම් කර ඇත. කාන්තාවන් ආර්ථිකයට ක්‍රියාකාරී නොවීමට බලපාන අධ්‍යාපන මට්ටම හා ආර්ථිකයට ක්‍රියාකාරී නොවන කාන්තාවන්ගේ පාසල අතර ස්වායත්තතාව පරීක්ෂා කිරිමේදී ($x^2$= 30.587, P= 0.001) එම විචල්‍ය අතර සම්බන්ධතාවයක් පවතින බව පෙන්නුම් කර ඇත. කාන්තාවන් ආර්ථිකයට ක්‍රියාකාරී නොවීමට බලපාන පවුලේ ආර්ථික කටයුතුවල නිරත වීම හා පවුලේ උපයන්නාගේ රැකියාව අතර ස්වායත්තතාව පරීක්ෂා කිරිමේදී ($x^2$= 1.800, P=0.615) එම විචල්‍ය අතර සම්බන්ධතාවයක් නොපවතින බව පෙන්නුම් කර ඇත.

කාන්තාවන් ආර්ථිකයට ක්‍රියාකාරී නොවීමට බලපාන මවගේ අධ්‍යාපන මට්ටම හා ආර්ථිකයට ක්‍රියාකාරී නොවන කාන්තාවගේ අධ්‍යාපන මට්ටම ස්වායත්තතාව පරීක්ෂා කිරිමේදී ($x^2$= 1.295, P= 0.935) එම විචල්‍ය අතර සම්බන්ධතාවයක් නොපවතින බව පෙන්නුම් කර ඇත. කාන්තාවන් ආර්ථිකයට ක්‍රියාකාරී නොවීමට බලපාන කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම හා පවුලේ මාසික ආදායම ස්වායත්තතාව පරීක්ෂා කිරිමේදී ($x^2$= 16.221, P= 0.703) එම විචල්‍ය අතර සම්බන්ධතාවයක් නොපවතින බව පෙන්නුම් කර ඇත.

කාන්තාවන් ආර්ථිකයට ක්‍රියාකාරී නොවීමට බලපාන කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම හා විවාහය සිදුවූ ආකාරය ස්වායත්තතාව පරීක්ෂා කිරිමේදී ($x^2$= 5.357, P= 0.719) එම විචල්‍ය අතර සම්බන්ධතාවයක් නොපවතින බව පෙන්නුම් කර ඇත. කාන්තාවන් ආර්ථිකයට ක්‍රියාකාරී නොවීමට බලපාන කාන්තාවන්ගේ පියාගේ අධ්‍යාපන මට්ටම හා ආර්ථිකයට ක්‍රියාකාරී නොවන කාන්තාවගේ අධ්‍යාපන මට්ටම අතර ස්වායත්තතාව පරීක්ෂා කිරිමේදී ($x^2$= 11.928, P= 0.452) එම විචල්‍ය අතර සම්බන්ධතාවයක් නොපවතින බව පෙන්නුම් කර ඇත. කාන්තාවන් ආර්ථිකයට ක්‍රියාකාරී නොවීමට බලපාන කාන්තාවන් කවදාක හරි රැකියාවක නිරත වීම හා ආර්ථිකයට ක්‍රියාකාරී නොවන කාන්තාවගේ අධ්‍යාපන මට්ටම අතර ස්වායත්තතාව පරීක්ෂා කිරිමේදී ($x^2$= 4.403, P= 0.493) එම විචල්‍ය අතර සම්බන්ධතාවයක් නොපවතින බව පෙන්නුම් කර ඇත.

### 4.6 කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවීමට බලපාන හේතු සාධක පිළිබඳ ප්‍රධාන සංරචක විශ්ලේෂණය

කාන්තාවන් ආර්ථිකයට ක්‍රියාකාරී නොවීමට බලපාන සාධක ප්‍රධාන සංරචක 5 කට බෙදා දක්වා ඇත. මෙහි දී අධ්‍යාපනය, රෝගීභාවය යන රැකියාවක් නොකිරීමට බලපාන සමාජීය සාධකවල බලපෑම, පවුලේ සාමාජිකයන්ගේ බලපෑම තුලින් රැකියාවක් අවශ්‍ය නොවීම යන සාධකවල බලපෑම, රැකියාවක් කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් යටිතල පහසුකම්, සනීපාරක්ෂක හා වෙනත් පහසුකම් නොපැවතීම යන සාධකවල බලපෑම, රැකියාවක් කිරීමෙන් බලපොරොත්තු වන ආදායම පවුලේ අයගෙන් හෝ කෙසේ හෝ සාධනය වීම යන සාධකවල බලපෑම, විවාහය, දරුවන්, සංක්‍රමණය යන ප්‍රජා විද්‍යාත්මක හේතු මත රැකියාවක් නොකිරීමට පවතින සාධකවල බලපෑම යනුවෙන් සංරචක 5 කට වෙන් වී ඇත.

*වගු අංක 5: සංරචක නිර්මාණය කිරීම*

| | සංරචක | | | | |
|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 |
| උසස් අධ්‍යාපනය නිසා | 0.842 | | | | |
| රෝගීභාවය නිසා | 0.818 | | | | |
| ප්‍රමාණවත් අධ්‍යාපනයක් නොමැත | 0.928 | | | | |
| දෙමාපියන්ගේ ආදායම් ප්‍රමාණවත් නිසා | | 0.749 | | | |
| දරුවන්ගේ ආදායම් ප්‍රමාණවත් නිසා | | 0.591 | | | |
| ස්වාමියා උපයන ආදායම් ප්‍රමාණවත් නිසා | | 0.739 | | | |
| අඩු වැටුප් | | 0.877 | | | |
| විශ්‍රාම යාම නිසා | | 0.877 | | | |
| දරුවන්ගේ බලපෑම නිසා | | | 0.594 | | |
| ස්වාමියාගේ බලපෑම් නිසා | | | 0.747 | | |
| දෙමාපියන්ගේ බලපෑම නිසා | | | 0.777 | | |
| රැකියාවක් අවශ්‍ය නොවන නිසා | | | 0.691 | | |

| | | |
|---|---|---|
| රැකියා සඳහා අවස්ථා නැත | 0.697 | |
| ප්‍රවාහන අපහසුතා | 0.739 | |
| රැකියා ස්ථානයට ඇති දුර නිසා | 0.928 | |
| දරුවන් ලැබීම නිසා | | 0.487 |
| විවාහය නිසා | | 0.79 |

*මූලාශ්‍රය : නියැදි දත්ත (2019)*

ඒ අනුව කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවීමට බලපාන ප්‍රධාන සාධක ලෙස සමාජීය සාධක, බලපෑම් හා අවශ්‍ය නොවීම යන සාධක, පහසුකම් පැවතීමේ සාධක, පවුලේ ආර්ථික තත්ත්වය, ප්‍රජා විද්‍යාත්මක සාධක ප්‍රධාන වශයෙන් බලපාන බව මේ අනුව නිගමනය කල හැකිය.

## 5. සමාලෝචනය

### 5.1 නිගමනය

මෙහි දී ගත හැකි ප්‍රධානතම නිගමනය වන්නේ මෙම කාන්තාවන් හා ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන බව සම්පූර්ණ සත්‍යයක් නොවන බවයි. මේ ප්‍රදේශයේ විවාහක කාන්තාවන් ප්‍රධාන වශයෙන් ත්‍රිත්ව කාර්යභාරයක් ඉටු කරයි. එනම් දරුවන් රැක බලා ගැනීම, නිවසේ වැඩ කටයුතු ඉටු කිරීම හා පවුලේ ආර්ථික කටයුතු සඳහා දායක වීම යන්නය. මේ තත්ත්වය මත මෙම කාන්තාවන් නිවසේ වැඩ කටයුතු කිරීමට අමතරව ගව පාලනය, කුඹුරේ හේනේ වැඩ කටයුතු ආදියට පුරුෂයන්ටත් වඩා වෙහෙසේ. ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස ගොවිතැන් කරන අය හා වෙනත් රැකියාවල නිරත පුරුෂයන් පවා තම ඉඩම් වල වගා කිරීම් සිදු කරයි. මේ තත්ත්වය මත නිවසේ වැඩ කටයුතුවලට අමතර රාජකාරියක් ලෙස කාන්තාවන්ද මීට සම්බන්ධ වේ. කාන්තාවන්ට මෙම කාර්යයන් සඳහා වැටුපක් නොලැබේ. නමුත් මෙම වැඩ කොටස වෙනත් අයෙක් ලවා කර ගැනීමට යම් ගෙවීමක් කළ යුතුය. මේ නිසා කාන්තාවට නොලැබෙන මේ වැටුප පවුලේ ආදායම ලෙස ප්‍රධාන උපයන්නා වන ස්වාමියාගේ නමට ඇතුලත් වේ. මෙය මෙම ප්‍රදේශයට හා කෘෂිකාර්මික සමාජ තුළ හඳුනා ගත හැකි සාධකයක් වේ. මේ තත්ත්වය මත එළඹිය හැකි ප්‍රධාන නිගමනයක් වන්නේ මේ ප්‍රදේශය සඳහා ශ්‍රම බල සමීක්ෂණ වාර්තාවේ ඉදිරිපත් කර ඇති නිර්වචන නොගැළපෙන බවයි. එහෙත් මෙම කෘෂිකාර්මික පවුල්වල වගා කරනු ලබන කාල සීමාව හැරුණු විට අනෙකුත් කාලයේ දී මෙම කාන්තාව නිවසේ වැඩ කටයුතුවලට සීමා වීමක් දැක ගත හැක.

අවුරුදු දහයකට පෙර පැවැති යුධමය වාතාවරණය නිසා ප්‍රදේශයේ පැවති ඌන සංවර්ධනය නිසා යටිතල පහසුකම් සංවර්ධනය නොවීම හා ප්‍රවාහන පහසුකම් ඉහළ වර්ධනයක් පත් නොවීම තුළ ප්‍රදේශයේ වේගවත් චලනයක් සඳහා අවකාශ නොමැති වීම ද මෙයට බලපා ඇත. විදුලිය, ජලය හා මාර්ග වල ඌන සැපයුම තුළ ලංකාවේ වේගවත් සංවර්ධනයත් සමඟ තරඟ කිරීමට තවමත් මේ ප්‍රදේශ තවමත් සූදානම් වී නොමැත. ප්‍රාදේශීය වැසියන්ට අනුව ප්‍රවාහන පහසුකම් පෙර දශකයට වඩා දියුණුවක් දක්නට ලැබුණ ද රැකියා සඳහා යාමට දුර බැහැරතාවය මත රැකියාවකට දිනපතා යාමට ඊමට පහසුකම් අවමය. මෙම ප්‍රදේශය රැකියා අවස්ථා උත්පාදනය නොවීම ද, කාන්තාවන් හා ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවීමට බලපෑම් කර ඇත.

සීමිත රැකියා අවස්ථා පැවතීම තුළ සීමිත පිරිසකට පමණක් අවස්ථාව හිමි වන අතර එම රැකියා වලද අඩු වැටුප් මට්ටමක් පැවතීම නිසා කාන්තාවන් මීට යොමු වීම අඩුය. නිවසින් බැහැර වී දුර බැහැර ප්‍රදේශවලට රැකියා කරා යාමට සිදුවීමද ආර්ථිකයට ක්‍රියාකාරී නොවීමට බලපා තිබේ. අධ්‍යාපන මට්ටමේ පවතින අඩු බව නිසා රැකියා වෙළෙඳපොළ තුළ මෙම කාන්තාවට හිමි වී ඇත්තේ ඇඟලුම් කම්හල් පමණි. නමුත් විවාහය අඩු වයසින් සිදු වීම තුළ ස්වාමියාගේ බලපෑම හා දරුවන් ලැබීම නිසා තරුණ කාන්තාවන්ගේ ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවීම ඉහළ වේ. විශේෂයෙන් අඩු වයස් විවාහ නිසා කාන්තාවන් ඉක්මනින් ප්‍රජනන ක්‍රියාවලියට දායක වීම තුළ ඔවුනට ආර්ථික වශයෙන් ක්‍රියාකාරී වීමට පවතින අවස්ථා සීමිත වී තිබේ.

ස්වාමියා නොසිටින හෝ ස්වාමියා සිටින කාන්තාවන් පවා බොහෝ පිරිසක් අනියම් සම්බන්ධතාවලට යොමු වීමක් දැක ගත හැක. මෙයට හේතුව පවත්නා දුප්පත්කමයි. මේ තුළ අනියම් ස්වාමියාගෙන් යැපීමක් දැකිය හැකි අතර පවුල් ආරවුල් සඳහා මේ තත්ත්වය බලපා තිබේ. මේ තුළ කාන්තාවන්ට නිවසෙන් පිටතට යාමට පවතින අවස්ථා අවම වේ. පැවති යුධමය මානසිකත්වය නිසා බොහෝ පවුල්වල පිරිස් රජයෙන් සහනාධාර බලාපොරොත්තු වේ. මේ තත්ත්වය තුළ ජීවන මට්ටම ඉහළ යාමක් ප්‍රදේශයේ නොමැත. කාන්තාවන් යැපුම් ආර්ථිකයක් තුළ තවමත් කටයුතු කරන බව හඳුනාගත හැක.

### 5.2 යෝජනා

ප්‍රදේශයේ ප්‍රවාහන පහසුකම්, ජල පාලනය, විදුලිය ආදී යටිතල පහසුකම් නගරයට ආසන්නව සංවර්ධනය වී පැවතියද එම තත්ත්වයද වැඩි දියුණු කිරීමට ග්‍රාම නිළධාරී වසම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුලට දැනුවත් කර එම අවශ්‍යතා ලගා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. කාන්තාවන් සඳහා නව රැකියා අවස්ථා විශේෂයෙන් ස්වයං රැකියා, ඇඟලුම් කම්හල්, වෙනත් කෘෂිබෝග වගාව ආදී තත්ත්වයන් ඇති කිරීමේ පහසුකම් ලබා දීම වැදගත් වේ. ඒ සඳහා නුපුහුණු ශ්‍රමිකයින්ට පුහුණුවක් ලබා දීම, අඩු ආදායම්ලාභී පවුල්වලට සහනාධාර ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පුළුල් රැකියා අවස්ථා ඇති කිරීම අවශ්‍ය වේ. එම පවුල්වලට ඉතුරුම් ක්‍රම පෙන්වා දීම මගින් ග්‍රාමීය බැංකු, සණස බැංකු ඇති කිරීමටත් එමගින් මුදල් හුවමාරුව කාර්යක්ෂම කර ගැනීමට හැකියාව ඇත. පවුල් පාලනය සම්බන්ධ දැනුම වර්ධනය වන වැඩසටහන් සැකසීම තුලින් කාර්යක්ෂම හා සාර්ථක නිවැරදි පවුල් පාලනයක අවශ්‍යතාවය පෙන්වා දිය යුතුය. වෘත්තීය පුහුණු ආයතන සමීප ප්‍රදේශවල ඇති කිරීම මගින් කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම, දැනුම හා හැකියාවන් වර්ධනය කිරීම අවකාශ සැලසිය යුතු වේ. ග්‍රාමීය කෘෂි කර්මාන්තය කාන්තාවන් ඉලක්ක ගත කොට සංවර්ධනය කිරීමට නිවැරදි මුදල් පාලනයක් බෝග වගා කිරීමේ හා සාර්ථක අස්වැන්නක් ලබා දීමට වැඩසටහන් හා දැනුවත් කිරීම තුලින් කටයුතු කිරීම වැදගත් වේ. වල් අලි ගැටලුව විසඳීමට තාක්ෂණයෙන් උසස් විදුලි වැටක් හා ආරක්ෂාකාරී වැඩපිළිවෙලක් සැකසිය යුතු වේ. ජල ගැටලුව විසඳීමට සාර්ථක පිරිසිදු ජල පාලනයක් ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීම වැදගත් වේ. ප්‍රදේශයේ ගොවීන්ගේ ඉඩම් ගැටලු විසඳිමට නිරවුල් ඉඩම් ඔප්පු හා එයට වැඩපිළිවෙලක් ඇති කිරීම, විදුලි බලය පමණක් නොව ගම තුලට තාක්ෂණය ගෙන ඒමට කටයුතු කිරීම, විවාහය සම්බන්ධව ප්‍රදේශය පවතින තත්ත්වය වෙනස් කිරීමට පාසල් මගින් ස්ත්‍රී හා පුරුෂ යන යන දෙපාර්ශ්වයටම දැනුවත් කිරීම වැදගත් වේ.

ප්‍රදේශයේ පාසල් සංවර්ධනය මගින් ළමයින් පාසල් නොයාමට හේතු හඳුනා ගෙන ඒ සඳහා පවුල් දැනුවත් කිරීම ග්‍රාම නිළධාරී මට්ටමින් පියවර ගැනීම වැදගත් වේ. ඉහළ අධ්‍යාපනයක අවශ්‍යතාවය පාසල තුලින්ම පහදා දීම වැදගත් වේ. කාන්තාවන්ට වන බලපෑම් පාලනයට ස්වාමිපුරුෂයින්, දෙමාපියන්, පවුලේ සාමාජිකයින්ට විවිධ සමිති සංවිධාන යොදාගෙන දැනුවත් කිරීම වැදගත් වේ. අධ්‍යාපනය පමණක් නොව එයට සමගාමීව බාහිර ක්‍රියාකාරකම්, ක්‍රීඩාව තුලින් දක්ෂතා වර්ධනය කිරීමට කටයුතු කිරීම. ස්වයං රැකියා ආරම්භ කිරීමට අවශ්‍ය පසුබිම, දැනුවත් කිරීම් හා ණය ආධාර ලබා දීමට කටයුතු කිරීම ආදී යෝජනා තුලින් මෙම අම්පාර දිස්ත්‍රික්කයේ පවතින ගැටලුව විසදා ගැනීමට හැකිවනවා පමණක් නොව අනාගත පුරවැසියන්ගේ සුභසිද්ධියට වැදගත් වනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


Asian Development Bank. (2012). Asian Development Outlook. https://www.adb.org/sites/default/files/publication/29704/ ado2012. pdf

Caritas Aotearoa New Zealand. (2010). Annual Report. (2010). https://reliefweb.int/sites/reliefweb.int/files/resources/Caritas%20AR%2010_final_web.pdf

Central Bank of Sri Lanka. (2016). Annual Report 2016 https://www.cbsl.gov.lk/en/publications/economic-and-financial-reports/annual-reports/annual-report-2016

Central Bank of Sri Lanka. (2017). Annual Report 2017 https://www.cbsl.gov.lk/en/publications/economic-and-financial-reports/annual-reports/annual-report-2017

Central Bank of Sri Lanka. (2018) Economic & Social Statistics Of Srilanka. (2018). https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/statistics/otherpub/economic_and_social_statistics_of_SL_2018_e_0.pdf

Department of census and Statistics- Sri Lanka. (2018). Sri Lanka Labour Demand Survey. In Labour Force Survey - Annual Report. http://www.statistics.gov.lk/industry/Labour_Demand_Survey_2018_Report.pdf

Gunasekara, V., Najab, N., & Munas, M. (2015). No silver bullet: An assessment of the effects of financial counselling on decision-making behaviour of housing beneficiaries in Jaffna and Kilinochchi.

Hyslop, D. R. (2003). State Dependence, Serial Correlation and Heterogeneity in Intertemporal Labor Force Participation of Married Women. State Dependence, Serial Correlation and Heterogeneity in Intertemporal Labor Force Participation of Married Women, 1. https://onlinelibrary.wiley.com/doi/abs/10.1111/1468-0262.00080

International Labour Organization. (2014). Global estimate of forced labour. https://www.ilo.org/wcmsp5/groups/public/---dgreports/ dcomm/documents/publication/wcms_243961.pdf

International Labour Organization. (2018). ILO’s Social Finance. https://www.ilo.org/wcmsp5/groups/public/ed_emp/documents/publication/wcms_714125.pdf

Mincer, J. (1962). Labor Force Participation of Married Women: A Study of Labor Supply. *Bureau of Economic Research,* 1–45. https://www.nber.org/chapters/c0603.pdf

Mincer, T. J., Jensen, P. R., Kauffman, C. A., & Fenical, W. (2002). Widespread and persistent populations of a major new marine actinomycete taxon in ocean sediments, *Applied and Environmental Microbiology*, 68(10), 5005–5011. https://doi.org/10.1128/AEM.68.10.5005-5011.2002

Salway, S. (2003). A Profile of Women’s Work Participation Among the Urban Poor of Dhaka. https://www.sciencedirect.com/science/article/abs/pii/ S0305750X03000160

Semasinghe, W. M. (2017). Women’s Labor Force Participation in Sri Lanka: An Inquiry into the Factors Influencing Women’s Participation in the Labor Market. International Journal of Social Science and Humanity, 7(3), 184–187. https://doi.org/10.18178/ijssh.2017.v7.816

Unlocking Women’s Potential in Sri Lanka’s Labor Force. (2017). Unlocking Women’s Potential in Sri Lanka’s Labor Force. https://nl4worldbank.org/2017/11/28/unlocking-womens-potential-in-sri-lankas-labor-force/

World Development Report: Gender Equality and Development. (2012). The World Bank. https://openknowledge.worldbank.org/handle/ 10986/4391

පුෂ්පකුමාර, එච්. ආර්., (2019). ගෝලීය කාන්තාව හා සමාජය

රත්නායක, ආර්. ජේ. යූ. සී., (2016). නූතන ලාංකීය කාන්තාව සහ ආකල්ප විප්ලවය

විභූති, එම්., (2014). කාන්තාවන් ආර්ථිකයට දායක නොවීම පිළිබඳ අධ්‍යයනයක්